**<u>ලංසු සඳහා ආරාධනයයි.</u>**
**<u>මාලිම්බඩ ප්‍රාදේශීය සභාව</u>**
**<u>මාලිම්බඩ පොළ ඉහල මාලයේ ඉතිරි වැඩ ඉදි කිරීම.</u>**
**<u>ගල්ඇන්දකුට්ටිය ප්‍රජා ශාලාවේ ඉතිරි වැඩ ඉදි කිරීම.</u>**

01.මාලිම්බඩ ප්‍රාදේශීය සභාවේ ප්‍රසම්පාදන කමිටුව විසින් පහත කර්මාන්ත ඉදිකිරීම සඳහා ජාතික තරඟකාරී කැඳවීම ඔස්සේ මුද්‍රා තබන ලද ලංසු කැඳවනු ලැබේ.

I. මාලිම්බඩ පොළ ඉහල මාලයේ ඉතිරි වැඩ ඉදි කිරීම - ඇස්තමේන්තු මුදල රු.9243647.17
II. ගල්ඇන්දකුට්ටිය ප්‍රජා ශාලාවේ ඉතිරි වැඩ නිම කිරීම -ඇස්තමේන්තු මුදල රු.6810394.62

02.මුදල් චක්‍රලේඛ 4/2016 ( III ) අනුව ඉදිකිරීම් කර්මාන්ත සංවර්ධන අධිකාරියේ (CIDA ) ගොඩනැගිලි සඳහා C6 හෝ C7 ශ්‍රේණිවල දකුණු පළාත තුල ලියාපදිංචි කොන්ත්‍රාක්කරුවන්ට කොන්ත්‍රාත්තුව පිරිනමනු ලබයි.

03.ලංසු ලේඛන 2024.08.20 දින සිට 2024.09.03 දින දක්වා පෙ.ව.9.00 සිට ප.ව.2.00 අතර කාලය තුල ලිඛිත අයදුම්පතක් ඉදිරිපත් කර, එක් අයදුම්පතක් සඳහා රු.2500.00 ක ආපසු නොගෙවන ලංසු ලේඛන ගාස්තුවක් ගෙවා ලබාගත හැක.

04.ඉදිරිපත් කරන ලංසු සඳහා පිළිවෙලින් රු.100000.00 ක හා රු.70000.00ක ආපසු ගෙවන ලංසු සුරක්ෂණයක් මුදලින් හෝ බැංකු සුරක්ෂණයකින් ඉදිරිපත් කල යුතුය.

05.ලංසු පිටපත් 2024.09.03 දින ප.ව.2.00 ට පෙර පහත ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවීම හෝ කාර්යාලයේ තබා ඇති ටෙන්ඩර් පෙට්ටියට බහා ලීමෙන් ඉදිරිපත් කළ හැකිය. ලංසු ලේඛණ භාර ගැනීම අවසන් වූ වහාම ලංසු විවෘත කෙරෙන අතර ලංසු ඉදිරිපත් කර ඇති ලංසු කරුට හෝ ඔහු විසින් බලය පවරා ඇති නියෝජිතයකුට එම අවස්ථාවට සහභාගි විය හැකිය.

06.වැඩිදුර තොරතුරු සඳහා පහත සඳහන් කාර්යාලීය වෙබ් අඩවිය භාවිතා කරන්න.

**වෙබ් අඩවි ලිපිනය - www.malimbadaps.lk**
**දුරකථන අංකය - කාර්යාලය - 041-2240208**(ලේකම් හෝ කර්මාන්ත විෂය නිළධාරී)
**ෆැක්ස් අංකය - 041-2240093**
**ඊ මේල් ලිපිනය - malimbada.ps@gmail.com**

සභාපති
මාලිම්බඩ ප්‍රාදේශීය සභාවේ ප්‍රසම්පාදන කමිටුව,
මාලිම්බඩ ප්‍රාදේශීය සභාව,
මාලිම්බඩ ,
පාලටුව.

**උපදෙස් පත්‍රිකාව**
**මාලිම්බඩ ප්‍රාදේශීය සභාව**

මාලිම්බඩ ප්‍රාදේශීය සභාවේ ප්‍රසම්පාදන කමිටුවේ සභාපති විසින් පහත සදහන් වැඩ විෂය සඳහා 2024.09.03 දින ප.ව.2.00 දක්වා මුද්‍රා තබන ලංසු පත් භාර ගනු ලබයි. නියමිත පරිදි සකස් කරන ලද ලංසු අයදුම්පත් මාලිම්බඩ ප්‍රාදේශීය සභාවේ ලංසු පත් බහාලන පෙට්ටියට හෝ ලියාපදිංචි තැපෑලෙන් ප්‍රසම්පාදන කමිටුවේ සභාපතිට 2024.09.03 දින ප.ව.2.00 ට පෙර ලැබීමට සැලැස්විය යුතු අතර එකී වේලාවට මෙම කාර්යාලයේදි ටෙන්ඩර් කරුවන් ඉදිරියේ ලංසුපත් විවෘත කරනු ලැබේ.

| අනු අංකය | විස්තරය | ආපසු නොගෙවන ලංසු තැන්පත් ( රුපියල්) | ඉදිකිරිම් සම්බන්ධ තොරතුරු ලබා ගත හැකි ආයතනය |
|---|---|---|---|
| 01 | මාලිම්බඩ පොදු වෙළඳපොලේ ඉහලමාලය ඉතිරි වැඩ ඉදිකිරිම. | 2500.00 | මාලිම්බඩ ප්‍රාදේශීය සභාව |
| 02 | ගල්ඇන්දකුට්ටිය ප්‍රජා ශාලාවේ ඉතිරි වැඩ ඉදි කිරීම. | 2500.00 | මාලිම්බඩ ප්‍රාදේශීය සභාව |

02.ටෙන්ඩර් සම්බන්ධව වැඩි විස්තර සතියේ වැඩ කරන දිනවල සාමාන්‍ය කාර්යාල වේලාවන්හිදි අදාල වැඩ විෂය අයත් මාලිම්බඩ ප්‍රාදේශීය සභා කාර්යාලය වෙතින් ලබා ගත හැක.

03.ලංසු ඉදිරිපත් කිරිමේදි කර්මාන්ත දෙක සඳහා පිළිවෙලින් රු.100000.00ක හා රු.70000.00ක ලංසු ඇපකරයක් ඉදිරිපත් කල යුතුය. මෙම ඇපකරය ශ්‍රී ලංකා මහ බැංකුව විසින් පිළිගත් බැංකුවක් මගින් හෝ ඉදිකිරිම් ආරක්ෂණ අරමුදල මගින් හෝ ලබාගෙන තිබිය යුතු අතර , එය කොන්දේසි විරහිත සහ ඉල්ලීම් කර විටක වහාම ප්‍රතිපූර්ණය කළ හැකි විය යුතුය. මෙම ඇපකරය ලංසු පතෙහි සඳහන් ආකෘතිය පරිදි විය යුතුය. තවද ලංසු ඇපකරයේ කාලය ලංසුපත් විවෘත කරන දිනයේ සිට 2024.11.18 දින දක්වා වලංගු විය යුතුය.

04.ඉදිරිපත් කරන ලංසුපත් බහාලන කවරයේ වම්පස උඩ කෙළවරේ කර්මාන්තයේ නම සඳහන් කළ යුතුය. ලංසුපත් පිටපත් දෙකකින් වෙන වෙනම ඉදිරිපත් ඉදිරිපත් කළ යුතු අතර, එහි මුල් පිටපත හා අනු පිටපත ලෙස සඳහන් කල යුතු අතර, අවසානයේ එක් කවරයක බහා ඉදිරිපත් කල යුතුය. ලංසු පත් විවෘත කරන අවස්ථාවේදි ලංසු පත් ඉදිරිපත් කරන්නන් සහ ඔහු වෙනුවෙන් බලය පවරන ලද නියෝජිතයකුට පැමිණ සිටිය හැක. මිල ගණන් අසම්පූර්ණ ලංසු පත් ප්‍රතික්ෂේප කරනු ලබන අතර ටෙන්ඩර් ඇප මුදල ද රාජ සන්තක කරනු ලැබේ. ලංසුපත් ඉදිරිපත් නොකරන ලංසු කරුවන්ගේ ටෙන්ඩර් ඇප මුදලද රාජ සන්තක කරනු ලැබේ.

05.ලංසු වලංගු කාලය දින 77 කි.

06.ප්‍රසම්පාදන කමිටුවේ සභාපතිගේ තීරණය අවසාන තීරණය වේ.

සභාපති,
මාලිම්බඩ ප්‍රාදේශීය සභාවේ ප්‍රසම්පාදන කමිටුව.